## මුසාලි ප්‍රාදේශීය සභාව
## මන්නාරම දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුව තිබුණි. කෙසේ වුවද ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2011 මැයි 09 දිනදී වන අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2010 ජූලි 02 දිනදීය.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මුසාලි ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මුසාලි ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතයවේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

උතුරු නැගෙනහිර පළාත් සේවා සංවර්ධන ව්‍යාපෘතියට (NELSIP) අදාළ රු.107,066 ක් වූ වියදම්, සමාලෝචිත වර්ෂයේ සභාවේ වියදම් ලෙස සලකා තිබුණි. එබැවින් වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

**විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**

විගණනයට අවශ්‍ය තොරතුරු නොමැතිවීම නිසා වටිනාකම රු.7,092.970 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සනාථ කිරීමට නොහැකි විය.

### 1.3.4 අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(අ) වගන්තිය | - | වර්ෂයකට රු.1,000 ඉක්මවූ ආගමික සහ පොදු වැඩ සඳහාවූ වියදම් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එවැනි අනුමැතියක් ලබානොගෙන ආහාර පාන, සඳහා රු.172,689 ක වියදමක් දරා තිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| | V වැනි පරිච්ඡේදයේ 140 වැනි වගන්තිය | - | රු.270,554 ක් වූ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 437 | - | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව වාහන 05 ක් සඳහා එකතුව රු.6,251 ක් වූ රක්ෂණ ආවරණ පෞද්ගලික රක්ෂණ සමාගමකින් ලබාගෙන තිබුණි. |
| (ඇ) | රජයේ ආයතන සංග්‍රහය | | |
| | VII පරිච්ඡේදයේ 12.3 වගන්තිය | - | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව ලේකම්වරයාට වැඩබැලීමේ වැටුප් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.68,805 ක් වූ මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,904,030 ක්වූ විය. එයට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.738,171 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | - | 02 | - | - | - | - |
| කල්බදු කුලී | 60 | 228 | - | - | 02 | - |
| බලපත්‍ර ගාස්තු | 30 | 66 | - | - | 14 | - |
| වෙනත් ආදායම් | 6,047 | 9,010 | - | 378 | 416 | - |

#### 2.2.2 මුද්දර ගාස්තු

සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත සහ තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය | ඇස්තමේන්තුගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 4,505 | 5,035 | (530) | 5,143 | 4,511 | 632 |
| වෙනත් වියදම් | 1,627 | 2,590 | (963) | 278 | 1,360 | (1,082) |
| උප එකතුව | 6,132 | 7,625 | (1,493) | 5,421 | 5,871 | (450) |
| ප්‍රාග්ධන වියදම් | 200 | 2,025 | (1,825) | - | 794 | (794) |
| මුළු එකතුව | 6,332 | 9,650 | (3,318) | 5,421 | 6,665 | (1,244) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 සෙැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික මට්ටම | 02 | 01 |
| ද්විතීය මට්ටම | 08 | 05 |
| ප්‍රාථමික මට්ටම | 15 | 11 |
| වෙනත් (අනියම්/තාවකාලික) | - | 05 |
| එකතුව | 25 | 22 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.697,424 ක් වූ අතර වර්ෂයකට අධික කාලයක් ඉක්මවූ ශේෂයන්හි වටිනාකම රු.270,554 ක් විය.

### 2.5.2 අයවිය යුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,361,661 ක් වූ සේවක ණය ශේෂය අයවිය යුතුව තිබුණු අතර වර්ෂයකට අධික කාලයක සිට හිඟ හිට තිබුණු ගිණුම් ශේෂයන්ගේ අගය රු.115,128 ක් විය.

### 2.5.3 සමීක්ෂණය නොකළ වත්කම්

--------------------------------

2010 දෙසැම්බර් 31 දනට වූ පොත් ශේෂය මත ගණනය කර තිබුණුවත්කම්වල අගය රු.18,069,371 ක් වූ අතර එය භෞතික හර්වැරදි බැලීම්/සමීක්ෂණ මණ්ඩල වාර්තාවකින් සනාත කර නොතිබුනි.

### 2.5.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් සනාථ නොකළ කරුණු

------------------------------------------------------------------

ප්‍රමාණවත් අධිකාර බලයකින් තොරව පහත සඳහන් වියදම් සභාවේ අරමුදලින් දරා තිබුනි.

(අ) ප්‍රදර්ශණයක් සඳහා රු.7,225 කට ධීවර ආම්පන්න මිලදී ගැනීම.

(ආ) ආපදා සහන කටයුතු සඳහා රු.25,000 ක ගෙවීමක් කිරීම.

### 2.6 කාර්යසාධනය

-----------------

සභාව ගිණුම් වර්ෂය ආරම්භයේදී ක්‍රියාකර් සැලැස්මක පිළියෙල කර නොතිබුණි. එනිසා සපුරා ගැනීමට අපේක්ෂිත අරමුණු සහ එහි ප්‍රගතිය සොයා දැනගැනීමට නොහැකි විය.

### 2.7 අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) වත්කම් කළමනාකරණය